ප්‍රවෘත්ති NEWS
විදේශ සේවා නියුක්ති කාර්යාංශය
Sri Lanka Bureau of Foreign Employment
Tel : 2872124 Fax 2872124 Email-slbfemedia@gmail.com slbfemedia2010@gmail.com

# කොරියානු භාෂා ප්‍රවීනතා විභාගයෙන් අයදුම්කරුවන් 3514ක් සමත්

14.10.2016
මාධ්‍ය ඒකකය



ඇගයුම් මත ලකුණු දීමේ ක්‍රමවේදය යටතේ පැවැත්වුණු පළමු කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයෙන් අපේක්ෂකයින් 3514 දෙනෙකු සමත් වී ඇති බව විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහන් කරයි. පසුගිය ඔක්තෝම්බර් 1 හා 2 යන දෙදින නිෂ්පාදන අංශයේ රැකියා සඳහා පැවති මෙම විභාගයට අයදුම්කරුවෝ 20187 දෙනෙකු ඉදිරිපත් වූහ. ධීවර අංශයේ රැකියා සඳහා විභාගය පසුගිය අගෝස්තු මස 8 සිට සැප්තැම්බර් මස 19 දක්වා දින 18ක් පැවැත්වූ අතර ඒ සඳහා අපේක්ෂකයින් 3118 දෙනෙකු ඉදිරිපත් වූහ.

නිෂ්පාදන අංශයේ විභාගයෙන් වැඩිම ලකුණු ප්‍රමාණය වන ලකුණු 98ක් ලබාගෙන ඇත්තේ අසංක ජිතුරංග මහතායි. ධීවර අංශයෙන් වැඩිම ලකුණු ප්‍රමාණය වන ලකුණු 77ක් ලබාගෙන ඇත්තේ දමින්ද ජයශාන්ත මහතායි. මෙම විභාගයෙන් ඉහල ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ගේ නාමලේඛනය කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය විසින් ප්‍රකාශයට පත්කර තිබේ. මෙවර විභාගය කියවීම ,සවන්දීම යටතේ පැවැත්වූ අතර එම ප්‍රශ්නපත්‍ර දෙකටම ලබාදුන් ලකුණු ප්‍රමාණය 100 කි. විභාගය කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක්ව පවත්වන ලදි.

මෙවර විභාගය සමත් වූවන්ගේ නාමලේඛනය, ලබාගත් ලකුණු ප්‍රමාණය, නිපුණතා පරීක්ෂණ දිනය හා වේලාව කාර්යාංශයේ www.slbfe.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. නිපුණතා පරීක්ෂණ ඔක්තොම්බර් මස 17 සිට 20 දක්වා අනුරාධපුර, මහනුවර, රත්නපුර, කඩවත, ගාල්ල, අතුරුගිරිය, සීදූව, තංගල්ල, කුරුණෑගල,ත්‍රිකුණාමලය, වව්නියාව, පොළොන්නරුව, බදුල්ල, මතුගම යන කාර්යාංශයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 14 කදී පැවැත්වෙන බව කාර්යාංශය නිවේදනය කරයි.

## ඇතුළත


- *කොරියානු භාෂා ප්‍රවීනතා විභාගයෙන් අයදුම්කරුවන් 3514ක් සමත්...* 1
- *සංචාරක වීසා මත කතුන් රැකියා සඳහා විදේශ ගතකිරීමට තැත්කල අයෙක් අත්අඩංගුවට...* 2
- *ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළින් විදෙස්ගත පවුල් ලියාපදිංචිය තවදුරටත්..* 3

# සංචාරක වීසා මත කාන්තාවන් රැකියා සඳහා විදේශ ගතකිරීමට උත්සහ කළ අයෙක් අත්අඩංගුවට

සංචාරක වීසා මඟින් ඩුබායි රටේ රැකියාවක් සඳහා පිටත්ව යාමට පැමිණි ත්‍රිකුණාමලය ප්‍රදේශයේ වයස අවුරුදු 21 ක කාන්තාවක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන ඒකකය විසින් අත්අඩංගුවට ගත් අතර, ඇයගේ ප්‍රකාශයට අනුව ඇයව විදේශ ගත කිරීමට උත්සාහ කළ සිදූ මොහොමඩ් හිසාන් නැමති මාවතපොළ, අලවතුගොඩ ප්‍රදේශයේ පුද්ගලයෙකු කොළඹ අලුත් කඩේ උසාවියේ ප්‍රදේශයේ තාවකාලික නවාතැන්පලකදී අත්අඩංගුවට ගැනීමට හැකි වුනි.

මෙම අවස්ථාවේදී ගමන්බලපත්‍ර 9 ක් ව්‍යාජ පවුල් පසුබිම් වාර්තා රැසක් කාර්යාංශයේ විමර්ෂණ ඒකකය භාරයට ගනු ලැබීය. ප්‍රශ්න කිරීම් වලදී අනාවරණය වූයේ දිවයිනේ දුරබැහැර ප්‍රදේශ වල කාන්තාවන් ගෙන්වා කොළඹ ප්‍රදේශයේ තාවකාලික ලැගුම්හල් තුල රඳවාගෙන සංචාරක වීසා මඟින් රැකියාවන් සඳහා විදේශ ගත කර ඇති බවයි.

මේ සම්බන්ධයෙන් විදේශ රැකියා අමාත්‍ය තලතා අතුකෝරළ මහත්මිය සඳහන් කළේ, කිසිඳු පුද්ගලයෙකුට සංචාරක වීසා මත රැකියා සඳහා විදේශ ගත විය නොහැකි බවයි. එසේ කරන පුද්ගලයින්ට තරාතිරම නොබලා නීතිය ක්‍රියාත්මක කරන බව අමාත්‍යවරිය වැඩිදුරටත් සඳහන් කළාය.

මෙම වැටලීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීති අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කීර්ති මුතුකුමාරණ මහතාගේ සහ, විශේෂ විමර්ශන ඒකකයේ කළමණාකරු ප්‍රධාන පොලිස් පරීක්ෂක අර්ජුන මාහින්කන්ද මහතාගේ උපදෙස් පරිදි, පොලිස් පරීක්ෂක ඩබ්. ඒ බාලසූරිය, නීති ක්‍රියාත්මක කිරීමේ නිළධාරී පොලිස් පරීක්ෂක එම්.එස්.ඩී අබේධීර, පොලිස් සැරයන් එස්.ජේ.පී රවීන්ද්‍ර මහත්වරුන් සහ විමර්ෂණ ඒකකයේ නිළධාරී සුනේත්‍රා මහත්මිය එක් වූහ.



# ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළින් විදෙස්ගත පවුල් ලියාපදිංචිය තවදුරටත්

2016 ජනවාරි 8 වන දින විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ශ්‍රමික සුරැකුම වැඩසටහන ආරම්භ කළ අතර, එමගින් අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිළධාරීන්ගේ (D/O) කාර්යභාරය වෙනදට වඩා වෙනස් වී ඇති බව විදේශ රැකියා අමාත්‍ය නීතීඥ තලතා අතුකෝරළ මහත්මිය ප්‍රකාශ කරයි.

මෙම නිළධාරීන්ගෙන් අපේක්ෂා කරන්නේ විදෙස්ගත පවුල්වල සුභසාධන කටයුතු සොයාබලා අවශ්‍ය පහසුකම් නිවැරදිව මෙම පවුල් සඳහා ලබාදීම මූලික කොටගත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. 2015 ජනාධිපතිවරණය සඳහා ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා ඉදිරිපත් කල මෛත්‍රී පාලනයක්- ස්ථාවර රටක් ප්‍රතිපත්ති මාලාවේ විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ප්‍රධාන කාරණා 3ක් සඳහන් කර තිබූ අතර, ඉන් විදෙස්ගත පවුල්වල සුභසාධනය පිළිබඳව සොයාබැලීම ප්‍රධාන කාරණයක් බවට පත්වන්නේ ඒ හරහා විදෙස්ගත පවුල්වල කටයුතු සොයාබැලීමේ වගකීම විදේශ රැකියා අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිළධාරීන්ට පැවරීම මගිනි. මෙමගින් විදෙස්ගත පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සෞඛ්‍යමය ගැටළු ඔවුන්ට පැනනැගෙන සමාජීය ගැටළු සොයාබැලීම මූලික අරමුණ කරගනිමිනි.

කෙසේ නමුත් පහුගිය කාලයේ සංවර්ධන නිළධාරීන්ගේ ප්‍රධානම කාර්‍යභාරය ලෙස පැවතියේ ගෘහ පාලන සහයිකාවන් ලෙස විදේශ ගතවන කාන්තාවන්ගේ පවුල් පසුබිම් වාර්තාව සකස් කර දීමයි. කෙසේ නමුත් වර්තමානය වන විට ශ්‍රමික සුරැකුම යටතේ තම රාජකාරි ප්‍රදේශයේ විගමණික ශ්‍රමිකයින් පිළිබඳව සිතියමක් සකසා සෑම විගමණික ශ්‍රමික පවුලක් සඳහාම ලිපිගොනුවක් සැකසීම හා එහි දත්ත යාවත්කාලීන කරමින් සෑම විගමණික පවුලක් සඳහාම සමාජ වාර්තාවක් සැකසීම, අවධානම් සහිත පවුල් හඳුනාගෙන එම පවුල් සඳහා පවුල් සංවර්ධන සැලැස්මක් සැකසීම මූලික කාර්ය භාරය වේ.

2016 ජනවාරි 8 දින සිට ජනවාරි 14 දක්වා ශ්‍රමික සුරැකුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම විදෙස්ගත පවුල්වල තොරතුරු එකතු කර ගැනීම සිදුකල නමුත් මෙම තොරතුරු ලබාදීම සඳහා දිවයිනෙන්ම 95,000ක පමණ පිරිසක් ලියාපදිංචි වූ අතර, එම වැඩසටහන තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කාර්යාල හරහා සිදුකෙරෙන බව අමාත්‍ය තලතා අතුකෝරළ මහත්මිය පවසයි. මෙම වැඩසටහන මඟින් බලාපොරොත්තු වන්නේ දිවයිනේ විදෙස් ගතවී රැකියා කරන පවුල් කොපමණ ගණනක් සිටින්නේද යන්න නිවැරදිව තහවුරු කරගැනීමත් ඒ හරහා සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. පසුගිය සමයේ විදෙස්ගත පවුල්වල සමාජ පරිසරය පිළිබඳව අධ්‍යනය කිරීමේදී පෙනී ගිය කරුණක් වන්නේ ඔවුන්ගේ පවුල් සංස්ථාව බිඳවැටීම සිදුවී ඇති බවයි. එම තත්වයන් පාලනය කරගැනීමට කටයුතු කිරීම සංවර්ධන නිළධාරීන්ගේ කාර්යභාරයේ තවත් වැදගත් කොටසක් ලෙස හැඳින්විය හැක.

ශ්‍රී ලංකාව පුරා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 හි විදේශ රැකියා අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිළධාරීන් තිදෙනා බැගින් සේවය කරන අතර, මේ වන විට සංවර්ධන නිළධාරීන් 941 දෙනෙක් සේවයේ නියුතු අතර, වැඩ තහනමට ලක්වූ සංවර්ධන නිළධාරීන් 09 දෙනෙකුද සිටිති.